ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය , අරමුදල් සහ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලයේ ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 හි 07 වන වගන්තියට අනුව විශ්වවිද්‍යාලයේ වියදමක් ලෙස හඳුනාගත නොහැකි විද්‍යා හා තාක්ෂණික මානව සම්පත් සංවර්ධන (STHRD) ව්‍යාපෘතියෙන් විශ්වවිද්‍යාලය වෙනුවෙන් දරා තිබුණු රු.60,825,232 ක පුනරාවර්තන වියදම් විශ්වවිද්‍යාලයේ වියදම් ලෙස හඳුනාගෙන තිබුණි. තවද මෙම ව්‍යාපෘතියෙන් විශ්වවිද්‍යාලයට ප්‍රදාන ලෙස නොලද රු.18,332,555 ක් විශ්වවිද්‍යාලයේ ප්‍රදාන ලෙස හඳුනාගෙන තිබුණි.	STHRD ව්‍යාපෘතියේ පුනරාවර්තන වියදම් සඳහා දරන ලද අගයම ආදායමක් ලෙසද ගිණුම්ගත කර ඇති බැවින් විශ්වවිද්‍යාලයේ වියදම් අඩු වී නොමැති බව ත් ව්‍යාපෘතියට අදාළ පුනරාවර්තන වියදම රු. 60,825,232 ක් ලෙස ලබා දී තිබූ අතර එම අගය ඇතුලත එම ව්‍යාපෘතිය තුල තිබූ වැටුප් හා අනෙකුත් වියදම් ඇතුලත් වීම ගිණුම්ගත කිරීම විගණන විමසුම තුලින් හඳුනාගත් අතර එය නිවැරදි කිරීමට කටයුතු කරන බව	ආයතනයට සෘජුව අදාල නොවන ආදායම් වියදම් අස්ථිත්වයේ මූල්‍ය ප්‍රකාශන තුලින් දැක්වීම සිදු නොකල යුතු අතර, අදාල නොවන ලෙස සිදු කර ඇති ගැලපීම් අවශ්‍ය පරිදි නිවැරදි කිරීමට කටයුතු කල යුතුය.
(ආ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 හි 07 වන ඡේදයට අනුව වාර්තාකරණ කාලපරිච්ඡේදය තුලදී මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනා ගත යුතු එකතුව රු.1,288,125 ක් සෘජුවම අදාල අරමුදල් ගිණුම් වලට හර කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි අතිරික්තය වැඩියෙන් දක්වා තිබුණි.	විශ්වවිද්‍යාලයේ සංවර්ධන අරමුදල සමන්විත වනුයේ ස්වයං උත්පාදන ආදායම මඟින් වන බවත්, මෙහි සඳහන් වියදම් මහා භාණ්ඩාගාරයේ මුදල් යොදාගත නොහැකි බැවින් මෙම අරමුදල් මඟින් නිසි අනුමැතීන්ට යටත්ව වියදම් සිදු කර ඇති බවත් ඉදිරියේ දී නිවැරදිව වියදම් මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කිරීමට කටයුතු කරන බව	දරන ලද වියදම් මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් ලාභය වැඩිපුර පෙන්වන බැවින් අදාල වියදම් නිසිපරිදි මූල්‍ය ප්‍රකාශන තුලින් ගැලපීමට කටයුතු කල යුතුයි. ස්වයං මූල්‍ය උත්පාදන ආදායම් වලින් දරන වියදම් අදාල චක්‍රලේඛ වලට අනුගතව සිදු කළ යුතුය.

(ඇ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02		
(i)	මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ගොඩනැගිලි අත්පත් කර ගැනීම වෙනුවෙන් හා දිගුකාලීන ආයෝජන වෙනුවෙන් පිළිවෙලින් රු.5,947,064 ක් හා රු.2,684,086 ක් වැඩියෙන් හා අඩුවෙන් මුදල් ගලායාම් ලෙස හඳුනාගෙන තිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශන සමඟ 2024 සංශෝධිත මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව	2024 සංශෝධිත මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුය.
(ii)	මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇති ව්‍යවහාරික විද්‍යා පීඨයෙහි ජාතික විද්‍යා පදනමෙහි (NSF) ප්‍රදානයන්හි ශුද්ධ මුදල් ගලා ඒම රු.1,839,375 ක් වුවත් එය ශුද්ධ මුදල් ගලා යාමක් ලෙස දැක්වීම හේතුවෙන් ශුද්ධ මුදල් ගලා ඒම් රු.3,678,750 කින් අඩුවෙන් දක්වා තිබුණි.	ශුද්ධ මුදල් ලැබීම වැරදීමකින් මෙලෙස මුදල් ගලායාමක් ලෙස දක්වා තිබූ බව	සංශෝධිත මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේ දී මෙම වරද නිවැරදි කිරීමටත්, ඉදිරියේ දී මුදල් ගලා ඒම් හා මුදල් ගලා යාම් නිවැරදිව හඳුනාගෙන වාර්තා කිරීමටත් කටයුතු කල යුතුය.
(iii)	පෙර වර්ෂයන්ට අදාල ගැලපීම් ලෙස හඳුනාගත් රු. 26,635,681 ක වටිනාකම සමුච්චිත පුනරාවර්තන අරමුදලින් ගලපා තිබුණු අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සමාලෝචිත වර්ෂයේ අතිරික්තය මුදල් බවට පත්කිරීමේ දී මෙම ලාභයට අදාල නොවන එම වටිනාකමද ගැලපීමට කටයුතු කර තිබුණි.	පෙර වර්ෂවල ගැලපීම් අදාළ උපචිත/ලැබිය යුතු ගිණුම් වලින් නිවැරදිව ඇති බවත්, එහි බලපෑම මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල අන්තර්ගත වන නමුත් අතිරික්තයට වන ගැලපීම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අන්තර්ගත නොවීමෙන් මුදල් ප්‍රවාහයේ අගය නිවැරදි නොවන බව	ප්‍රමිතියෙන් ලබා දී ඇති මඟපෙන්වීම අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමට පියවර ගත යුතුය.
(ඈ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 හි 47 වන වගන්තිය ප්‍රකාරව පසුගිය වර්ෂවල මූල්‍ය ප්‍රකාශන මත සිදුකරනු ලබන වැරදි නිවැරදි කිරීම් වලට අදාලව වරද සිදුවූ	ප්‍රමිති අංක 03 හි 47 වගන්තියට ප්‍රකාරව ඉදිරියේ දී කටයුතු කරනු ලබන බව	මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී ප්‍රමිතින්ට අනුකූල ලෙස ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

	කාලපරිච්ඡේදය වෙනුවෙන් ඉදිරිපත් කරන සංසන්දනාත්මක තොරතුරු නැවත ප්‍රකාශ කිරීමක් කළ යුතු වුවද විශ්වවිද්‍යාලයෙහි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ඒ අනුව කටයුතු කර නොතිබුණි.		
(ඉ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 28 වන ඡේදයට අනුව ප්‍රාග්ධනිත කළ නොහැකි, වියදමක් වන ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් ගෙවිය යුතු ප්‍රමාද ගාස්තු රු.202,941,475 ක් 2024 වර්ෂයේදී ප්‍රාග්ධනිත කර තිබීම හේතුවෙන් ගොඩනැඟිල්ලෙහි පිරිවැය හා සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. තවද ප්‍රාග්ධනිත කරන ලද එම වටිනාකම වෙනුවෙන් 2023 හා 2024 වර්ෂයන් සඳහා රු. 20,294,146 ක් ක්ෂය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා සමුච්චිත අරමුදල රු. 10,147,073 කින් අඩුවෙන්ද, ක්ෂය වෙන්කිරීම් ගිණුම වැඩියෙන්ද දක්වා තිබුණි.	වෛද්‍ය පීඨයේ පැරා සායනික ගොඩනැගිල්ල ඉදිකිරීමේ දී කොන්ත්‍රාත්කරු ඉල්ලා ඇති ප්‍රමාද ගාස්තු රු. 202,941,475ක මුදල ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ට අනුව නිවැරදි කිරීමට කටයුතු කරන බව	වැඩිපුර ප්‍රාග්ධනිත කර ඇති ගොඩනැඟිලි වටිනාකම මෙන්ම ක්ෂය වෙන්කිරීම්ද නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගැනීමත්, ඉදිරියේ දී වියදම් ගිණුම්ගත කිරීමේ දි නිසි පරිදි වර්ගීකරණය කිරීමෙන් අනතුරුව ගිණුම්ගත කිරීමත් කල යුතුය.
(ඊ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 69 වගන්තියට පටහැනිව ස්ථාවර වත්කම් මිලදී ගත් සම්පූර්ණ වර්ෂයටම ක්ෂය කිරීමටත් වත්කම් ඉවත් කරන වර්ෂයේදී ක්ෂය නොකිරීමටත් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන තිබුණි. ඒ හේතුවෙන් 2024 වර්ෂය තුළදී සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී ප්‍රාග්ධනිත කරන ලද වත්කම් කිහිපයක ක්ෂය රු.26,667,770 ක් වැඩියෙන් ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ අතිරික්තය හා ක්ෂය වෙන්	විශාල වශයෙන් සහ විවිධ වත්කම් මිල දී ගැනීමේ දී මෙලෙස වත්කම් පාවිච්චි කිරීම සඳහා සුදානම් තත්වයට ගෙන ආ පසු වත්කම් ක්ෂය කිරීම ආරම්භ කිරීම ප්‍රායෝගිකව අපහසු බැවින් ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුකූලව කටයුතු කර ඇති බවත් ඉදිරියේ දී නිවැරදි කිරීමට සලකා බලන බව	කුමන තත්ත්වයක දී වුවද ගිණුම්කරණ ප්‍රමිති ඉක්මවා ප්‍රතිපත්ති සකස් කර ගැනීමට ගිණුම්කරණ ප්‍රමිති වලින් ඉඩ ලබා දී නොමැති බැවින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 69 වගන්තිය ප්‍රකාරව ක්ෂය ගිණුම්ගත කළ යුතුය.

	කිරීම් එම ප්‍රමාණයෙන් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.		
(උ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 ට අනුව ප්‍රත්‍යාගණන අගය ලෙස වත්කමෙහි සාධාරණ අගය සැලකිල්ලට ගනු ලැබීමකින් තොරව විශ්වවිද්‍යාලය විසින් රක්ෂණය කිරීමේ අරමුණින් ලබා ගන්නා ලද තක්සේරු වාර්තාවක් පදනම් කරගෙන දෝෂ සහගත ලෙස 2022 වර්ෂයේ දී වාහන ප්‍රත්‍යාගණනය කර ප්‍රත්‍යාගණන ලාභය ලෙස රු.135,757,664 ක් හඳුනා ගෙන එම ප්‍රත්‍යාගණන වටිනාකම මත ක්ෂය වෙන්කිරීම් ද සිදු කර තිබුණි.	ඉදිරියේදී විධිමත් ප්‍රත්‍යාගණන ක්‍රමවේදයක් සියලුම මෝටර්රථ සඳහා අනුගමනය කරමින් නිවැරදි අගය ගිණුම් වලට ගැනීමට කටයුතු කරන බව	ඉදිරියේදී ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ දී ප්‍රමිතියෙන් ලබා දී ඇති මඟපෙන්වීම් අනුව සිදුකිරීමත්, දැනට මූල්‍ය ප්‍රකාශන තුල ගලපා ඇති වාහන ප්‍රත්‍යාගණන වටිනාකම පිළිබඳව නැවත සලකා බලා නිවැරදි ප්‍රත්‍යාගණන ක්‍රමවේදයට අනුව සියළුම වාහනවල ප්‍රත්‍යාගණන වටිනාකම අගය කර මූල්‍ය ප්‍රකාශන තුල ගැලපීය යුතුය.
(ඌ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 19 හි 85 හා 86 ඡේදවලට අනුව ප්‍රමාණවත් පරිදි උපකල්පන භාවිතා කර සේවක පාරිතෝෂික සඳහා වෙන්කිරීම් ගණනය කර නොතිබීම හා ඒ සඳහා අවශ්‍ය නම් විශේෂඥයකු ගේ සේවය ලබා ගැනීමට හැකියාව තිබියදි එසේ කටයුතු කර නොතිබීමත් හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට සේවක පාරිතෝෂික දීමනා වෙන් කිරීම් ගිණුමේ පවත්නා රු.833,662,211 ක ශේෂයෙහි නිවැරදිතාවය තහවුරු කර ගත නොහැකි විය.	විගණන නිරීක්ෂණයට එකග වන බවත් 2024 දි රාජ්‍ය විගණන ප්‍රමිති අංක 19 ට අනුකූල වීම සිදු කළ යුතු බැවින් පොදු සූත්‍රගතකරණයට අදාළ දත්ත භාවිතා කරමින් ගණනය සිදු කරන ලද බවත් ඉදිරි වසරේ ආයුගණක විශේෂඥයෙකු ගේ සේවය ලබා ගැනිමට කටයුතු කරන බව	මූල්‍ය ප්‍රකාශන තුල සේවක පාරිතෝෂික වෙන්කිරීම් සැලකිය යුතු වටිනාකමක් නියෝජනය වන බැවින් වඩාත් උචිත ක්‍රමවේදයක් භාවිතා කර නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුලින් හෙලිදරව් කිරීමට කටයුතු කල යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 වර්ෂයේ දී අවස්ථා 31 දී මුදලින් ගෙවන ලද රු.1,296,486 ක වියදම් නැවතත් එම වර්ෂයේදීම ගෙවිය යුතු වියදම් ලෙස හඳුනාගැනීම හේතුවෙන් සමුච්චිත අරමුදල හා ණයහිමි වටිනාකම එම ප්‍රමාණයෙන් පිළිවෙළින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි.	එය ද්විත්ව ගණනය කිරීමක් වන බැවින් ඉදිරියේ දී නිවැරදි කිරීමට පියවර ගන්නා බව	ප්‍රමාණාත්මක අවදානමක් සහිත අවස්ථාවක් වන බැවින් මේ සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමුකර විධිමත් විශ්ලේෂණයකින් පසුව නිවැරදි කිරීමටත්, වියදම් දැරීමේ දී දැනට පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතිය විශ්ලේෂණය කර එය ශක්තිමත් කිරීමට හෝ නව ක්‍රමවේදයක් හඳුන්වාදීමට පියවර ගත යුතුය.
(ආ)	පෞද්ගලික ආයතනයකින් විශ්වවිද්‍යාලයට ලැබිය යුතු ලෙස හඳුනාගන්නා ලද රු.2,190,890 ක් වටිනාකම ඉකුත් වර්ෂයකදී එම ආයතනයට ගෙවිය යුතු බිල්පත්‍රයකින් අඩුකර ගෙන තිබියදී සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ලැබිය යුතු වටිනාකමක් ලෙස තවදුරටත් හඳුනා ගෙන තිබීම හේතුවෙන් ලැබිය යුතු වටිනාකම හා සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	විගණන නිරීක්ෂණය හා එකඟ වන බවත් ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව	සිදු වී ඇති වරද නිවැරදි කර සත්‍ය වශයෙන්ම ලැබිය යුතු ශේෂය මූල්‍ය ප්‍රකාශන තුළින් නිරූපණය කළ යුතුය.

(ඇ)	ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් නිකුත් කරන ලද 2025 පෙබරවාරි 07 දිනැති අංක 05/2025 දරන චක්‍රලේඛයට අනුව 2024 දෙසැම්බර් 31 දිනට කෘෂි විද්‍යා පීඨයට අයත් ගොවිපොළෙහි පශු සම්පත් තොගයෙහි වටිනාකම (භාවුන් හැර) රු.8,506,748 ක් විය යුතු වුවද, එම වටිනාකම රු.13,550,100 ක් ලෙස දැක්වීම හේතුවෙන් පශුසම්පත් තොගයේ වටිනාකම හා ප්‍රත්‍යාගණන සංචිතය රු.5,043,352 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	නවතම චක්‍රලේඛය මෙම වාර්තාව සකස් කරන අවස්ථාවේදී නිකුත් කර නැති බැවින් පෙර පැවති චක්‍රලේඛය පදනම් කරගෙන සතුන්ගේ සත්‍ය වටිනාකම අගය කර ඇති බවත් නව චක්‍රලේඛය අනුව කටයුතු සිදු කිරීමට පියවර ගනු ලබන බව.	2024 පශුසම්පත් තොගය ගණනය කිරීම සඳහා මෙම චක්‍රලේඛය යොදා ගන්නා ලෙස ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය දන්වා තිබීමත්, මූල්‍ය ප්‍රකාශන විගණනයට ලබා දීමට නියමිත කාලය සලකා බලන විට චක්‍රලේඛය භාවිතා කිරීමට ප්‍රමාණවත් කාලයක් පැවතීමත් හේතුවෙන් නව චක්‍රලේඛයට අනුගතව පශු සම්පත් තොගය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.
(ඈ)	විශ්වවිද්‍යාල පරිපාලන ගොඩනැගිල්ල සැලසුම් සැකසීමට අදාලව උපදේශන සේවා සැපයූ සමාගම විසින් පවරා තිබුණු නඩුවට අදාලව 2024 සැප්තැම්බර් 05 දින අධිකරණය විසින් ලබා දුන් තීන්දුව ප්‍රකාරව එම ආයතනයට ගෙවීමට සිදුවූ රු.1,067,688 ක මුදල සෘජුවම විශ්වවිද්‍යාලයේ බැංකු ගිණුමෙන් අඩුකර තිබියදීත් අදාල වියදම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය තුල සටහන් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා මුදල් පොතේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	උපදේශන සේවා සමාගමක් විසින් පැවරූ නඩුවට අනුව රු.1,067,688 මුදල අඩු කළ බව ලංකා බැංකුව විසින් 2024.09.19 වන දින දරන ලිපිය මඟින් දැනුම් දී ඇති බවත් එහි පිටපත ලැබුණු පසු මුල්‍යාධිකාරී විසින් මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු වෙනුවෙන් මුදල් කමිටුව වෙත ඉදිරිපත් කරන ලෙස ලේඛකාධිකාරිවරයා වෙත දන්වා යවා ඇති බවත් ඒ සඳහා නීතිමය අනුමැතිය සහිතව ගෙවීම් වවුචර් පතක් හෝ අදාල ව්‍යාපෘතිය කුමක් ද යන්න තොරතුරු නොලැබීමෙන් ගිණුම්වලට ගැලපීම් කළ නොහැකි බවත්, ඉදිරියේ දී එය ලබා ගැනීමෙන් අනතුරුව නිවැරදිව ගැලපීමට කටයුතු කරන බවත් COPE කමිටුවේ තීරණයට අනුව මෙම අගය පොත්වලින් කපා හැරීමට අවශ්‍ය කටයුතු කරන බව.	මෙම වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුල ගැලපීමටත්, ඉදිරියේ දී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ආයතනයේ සියලු අංශ දැනුවත් කර අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට විධිමත් ක්‍රමවේදයක් සැකසීමටත් කටයුතු කළ යුතුය.

(ඉ)	ව්‍යවහාරික විද්‍යා පීඨය ඉදිකිරීමේ අදියර 1 හි උපදේශන සේවා සැපයීමේදී මතු වූ ගැටළුවකට අදාළව පවත්නා නඩුවේ දී අධිකරණය විසින් පෞද්ගලික ආයතනයකට ගෙවිය යුතු බවට තීරණය කරන ලද රු. 6,625,106 ක් විශ්වවිද්‍යාලයෙහි බැංකු ගිණුමක රඳවාගෙන තිබුණද ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන තුල වෙන් කිරීමක් සිදු කර නොතිබුණි.	විගණක සමඟ එකග වන බවත සහ නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව	මෙයට අදාල නිවැරදි වටිනාකම හඳුනාගැනීමෙන් පසු මූල්‍ය ප්‍රකාශන තුල ගැලපීමට කටයුතු කල යුතුය.
(ඊ)	විශ්වවිද්‍යාලය විසින් 2024 වර්ෂයේ උපාධි ප්‍රදානෝත්සවය වෙනුවෙන් බණ්ඩාරනායක අනුස්මරණ ශාලාව වෙන්කිරීම සඳහා මුලිකව ගෙවන ලද රු.500,000 ක මුදල ආපසු නොගෙවන බව ඉන්වොයිසියේ සඳහන්ව තිබියදී වර්ෂයේ වියදමක් ලෙස හඳුනාගැනීමකින් තොරව තැන්පතු වටිනාකමක් ලෙස හඳුනාගෙන තිබීම හේතුවෙන් එම වටිනාකමින් වර්ෂයේ අතිරික්තය හා තැන්පතු වැඩියෙන් දක්වා තිබුණි.	බණ්ඩාරනායක අනුස්මරණ ශාලාව වෙන් කිරීමට අදාල ගාස්තු සම්බන්ධ විගණන විමසුම පිළිගන්නා බවත් එය ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරන බව	වර්ෂයේ අතිරික්තය හා තැන්පතු වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීමේ වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.
(උ)	විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ කර්මාන්තයේ මිල විචලනයන් වෙනුවෙන් ගෙවිය යුතු ලෙස 2023 වර්ෂයේදී හඳුනාගන්නා ලද මෙතෙක් නොගෙවන ලද රු.5,648,479 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශන තුල ප්‍රතිපාදන වෙන්කිරීමට කටයුතු කර නොතිබුණි.	විගණන විමසුම පිළිගන්නා බවත් එය ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරන බව	මෙම වරද නිවැරදි කිරීමටත්, ගෙවිය යුතු දිනය හා ගෙවිය යුතු වටිනාකම නිශ්චිත නොවුවද අනිවාර්යයෙන් ගෙවියයුතු වටිනාකම් සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.

(ඌ)	විශ්වවිද්‍යාලයේ තාක්ෂණික පීඨ විද්‍යාගාර තුළ 2024 දෙසැම්බර් 31 දිනට පැවති රු.4,877,088 ක් වටිනා රසායනික ද්‍රව්‍ය තොගය (chemicals & Glassware) ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා තොගය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	STHRD ව්‍යාපෘතියෙන් ලද තොගය පිළිබඳව 2024 අවසාන ගිණුම් සකසන විට ද තොරතුරු ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් එය ගිණුම්ගත කිරීම මඟ හැරී ඇති බවත් විගණන නිරීක්ෂණය මත එය නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව	මූල්‍ය ප්‍රකාශන තුලින් මඟ හැරුණු මෙම තොගය මූල්‍ය ප්‍රකාශන තුල ගැලපීමටත්, ඉදිරියේ දී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී විශ්වවිද්‍යාලයේ ප්‍රධාන ගබඩා, උප ගබඩා, විද්‍යාගාර සහ අනෙකුත් ස්ථානවල වර්ෂය අවසානයට පවතින තොග නිවැරදි පරිදි සමීක්ෂණය කර ගිණුම්ගත කිරීමටත් පියවර ගත යුතුය.
(එ)	විශ්වවිද්‍යාලයේ පවිත්‍රතා සේවය සඳහා 2024 දෙසැම්බර් මාසය වෙනුවෙන් ගෙවිය යුතු රු.1,747,570 ක් වූ එකතුකල අගය මත බදු (VAT) වටිනාකම ගිණුම්ගත නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා ණය හිමියෝ එම ප්‍රමාණයෙන් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	සාමන්‍ය පාලන අංශය විසින් එවන ලද අපේක්ෂිත වියදම් ලේඛනයේ දක්වා තිබූ 2024 දෙසැම්බර් මාසය සඳහා ගෙවිය යුතු වටිනාකම ගිණුම් ගත කර ඇති බවත් එහි සඳහන් ව ඇත්තේ VAT රහිත මුදල වන අතර නිවැරදි වවුචරය ලැබී මෙන් පසු VAT ගලපා අදාල ජර්නල සටහන් යොදා මේ වන විට ගෙවීම් සිදු කර ඇති බව	ඉදිරියේ දී වියදම් සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමේ දී VAT සහිත මුළු වියදමට ප්‍රතිපාදන වෙන්කිරීමට අවශ්‍ය පියවර ගැනීමෙන් සමාලෝචිත වර්ෂයේ නිවැරදි ලාභය මූල්‍ය ප්‍රකාශ තුල දැක්වීමට කටයුතු කල යුතුය.

1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

	විෂයය	මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.	අනුරූපී වාර්තා අනුව වටිනාකම රු.	වෙනස රු.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ණයහිමියෝ ඉංජිනේරුමය කාර්යය පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට ගෙවිය යුතු වියදම	39,646,791	15,812,024	23,834,767	ඉදිරියේදී ණය හිමි ශේෂ තහවුරු කර ගැනීමෙන් අනතුරුව ගිණුම්වලට ගැළපීමට කටයුතු කරන බවත්, ශේෂ සනාථන ඉල්ලා සිටිය ද පිළිතුරු ලැබී නොමැති බවත්, එහෙත් CECB ආයතන විසින් 2022.08.04 එවන ලද ලිපිය මේ සඳහා පදනම් කර ගෙන ඇති බව	ඉංජිනේරුමය කාර්යය පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය සමඟ සාකච්ඡා කර එම ආයතනයට ගෙවිය යුතු වටිනාකම නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු ය.
(ආ)	උපචිත වියදම් එක්සත් පුවත්පත් සමාගමට ගෙවිය යුතු වටිනාකම	1,690,293	2,403,766	713,473	2024 වර්ෂයට හෝ ඊට පෙර වර්ෂවලට අදාල උපචිත වී ඇති වවුචර් පිළිබඳ එම ආයතනය විමසා නිවැරදි කිරීමට කටයුතු කරන බව	එක්සත් පුවත්පත් සමාගම සමඟ සාකච්ඡා කර සමාගමට ගෙවිය යුතු වටිනාකම නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු ය.
(ඇ)	තොග විදුලි සැපයුම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ තැන්පත් කර ඇති වටිනාකම	2,105,500	3,312,500	1,207,000	ගිණුම් අංශයේ වාර්තා අනුව 2013 ට පෙර සිට අදාල ලෙජර් ගිණුමේ ශේෂය ඉදිරියට රැගෙනවිත් ඇති බවත්, වර්තමානයේ පවතින ශේෂය වන රු.2,105,500.00 ක වටිනාකම 2022 සිට පැවත එන බවත්, විගණන විමසුම අනුව දක්වා ඇති නොසැසඳීම පිළිබඳ පාලන අංශය හරහා විදුලිබල	පිළිතුරෙන් ලබා දී ඇති පරිදි පාලන අංශය හා අදාල ආයතන සමඟ සාකච්ඡා කර නිවැරදි තැන්පතු වටිනාකම තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය.

					මණ්ඩලයෙන් දත්ත ලබා ගෙන තහවුරු කර ගැනීමට ඉදිරියේ දී කටයුතු කරන බව	
(ඇ)	විද්‍යා හා තාක්ෂණික මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (STHRD) යටතේ ලද ගොඩනැඟිලි වටිනාකම	3,637,659,333	3,783,718,901	146,059,568	නිල වශයෙන් ප්‍රමාණවත් තොරතුරු ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මඟින් (PMU) විශ්වවිද්‍යාලයට ලබා දී නොමැති බැවින් 2024.12.31 ට අදාල නිවැරදි අවසන් ගිණුම් ගෙන්වා ගැනීමෙන් අනතුරුව නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව	ව්‍යාපෘතියෙහි 2024.12.31 දිනට අවසන් ගිණුම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව ගොඩනැගිලි වටිනාකම නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විෂයය	මුදල (රු.)	නොසැපයූ විගණන සාක්ෂි	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දේපල පිරියත උපකරණ	15,346,456,151	(i) විස්තරාත්මක උපලේඛන (ii) ස්ථාවර වත්කම් ලේඛනය	වත්කම් ලේඛනය සාදා නිම කළ පසුව කෙරීගෙන යන වැඩ ගිණුමෙන් ඉවත් කර ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරනු ලබන බව	ස්ථාවර වත්කම් වලට අදාලව උපලේඛන සහ ස්ථාවර වත්කම් ලේඛනය කඩිනමින් සකස් කිරීම මඟින් ස්ථාවර වත්කම් වලට අදාල අභ්‍යන්තර පාලනය විධිමත් කළ යුතුය.
(ආ)	ණයහිමියෝ	10,741,198	(i) ශේෂ සනාථ (ii) ඉන්වොයිස්	මෙම ණය හිමියන් 2015 වර්ෂයේ සිට පැවත එන අතර විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි සත්‍ය ලෙස ම පවතී ද යන්න ඉදිරියේදී තහවුරු කිරීමට පියවර ගන්නා අතර ඒ අනුව ගැලපීම් කර නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව	ණයහිමියන් සම්බන්ධයෙන් ගැඹුරු විශ්ලේශණයක් කර, අදාල ණයහිමි ශේෂ සනාථ ලබා ගෙන ණයහිමියන් සම්බන්ධයෙන් පවතින ගැටළු නිරාකරණය කර ගැනීමෙන් අනතුරුව සත්‍ය ණයහිමියන් මූල්‍ය

		ප්‍රකාශන තුලින් නිරූපනය කිරීමට කටයුතු කළ යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ගෙවිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි පුනරාවර්තන ස්වරූපයේ උපචිත වියදම වූ රු.243,687,493ක් තුල වර්ෂ 5 ඉක්ම වූ රු.8,103,635 ක ශේෂයක් ද, වර්ෂ 2 ත් 5 ත් අතර කාලයක සිට පැවත එන රු. 5,455,221 ක නිරවුල් නොකරන ලද ශේෂයක් ද පැවතුණි.	2015 සිට පැවත එන රු.243,687,493 ක ශේෂය සහිත උපචිත වියදම් ගිණුම තවදුරටත් පරීක්ෂා කිරීමේ දී මෙම අගය තුල දැනටමත් ගෙවා නිම කර ඇති ගෙවීම් ලෙස හඳුනා ගෙන ඇති බවත් ඒවා නිවැරදි කර ජර්නල් සටහන් සමඟ ඉදිරියේ දී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව	මෙම උපචිත වියදම් තුල ඇති එක් එක් වියදම සම්බන්ධයෙන් විධිමත් විශ්ලේෂණයක් කර ගෙවා නිමකර ඇති බවට නිශ්චිත වූ වියදම් පැහැදිලිව හඳුනා ගෙන නිරවුල් කිරීමටත්, ගෙවා අවසන් නොවූ උපචිත වියදම් හඳුනාගෙන අදාල ශේෂයන් සනාථ කර ගැනීමෙන් අනතුරුව නිරවුල් කිරීමටත් පියවර ගත යුතුය.
(ආ)	මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ණයහිමියෝ සහ ගෙවියයුතු වියදම් ලෙස රු. 411,076,052 ක් දක්වා ඇති අතර ඒ තුල වර්ෂ 10 කට වඩා පැරණි රු.39,328,210 ක්ද වර්ෂ 01 ත් 10 ත් අතර පවතින රු. 9,760,054 ක නිරවුල් නොකල ශේෂයන් ද පැවතුණි.	පිළිතුරු සපයා නොතිබුණි.	මෙම ණයහිමි ශේෂය තුල ඇති කේවල ණයහිමි ශේෂයන් සම්බන්ධයෙන් විධිමත් විශ්ලේෂණයක් කර ගෙවා නිමකර ඇති බවට නිශ්චිත වූ වියදම් පැහැදිලිව හඳුනා ගෙන නිරවුල් කිරීමටත්, ගෙවා අවසන් නොවූ ණයහිමි ශේෂයන් හඳුනාගෙන අදාල ශේෂයන් සනාථ කරගැනීමෙන් අනතුරුව නිරවුල් කිරීමට ත් පියවර ගත යුතුය.

1.6.2 අත්තිකාරම්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව නිකුත් කරන ලද අග්‍රිම පියවීමට, අග්‍රිමය නිකුත් කරන ලද වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩියෙන් ප්‍රමාද නොකළ යුතු වුවත්, 2017 සිට 2024 කාලපරිච්ඡේදය තුළදී අවස්ථා 18 කදී පර්යේෂණ, පුනරාවර්තන, සහ මූලධන කාර්යයන් වෙනුවෙන් ලබා දෙන ලද එකතුව රු.2,267,873 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31	විවිධ අත්තිකාරම්(පුනරාවර්තන) නොපියවූ අත්තිකාරම් වලට අදාලව සිහි කැඳවීම් ලිපි මුදල් අංශය විසින් යවා තිබුණු බවත් විවිධ අත්තිකාරම්(ප්‍රාග්ධන) University of Moratuwa හැර අනිකුත් අත්තිකාරම් මේ වන විට පියවා ඇති බවත්,නොපිය වූ පර්යේෂණ අත්තිකාරම සඳහා කිහිපවිටක් සිහි කැඳවීම් කරන ලද බවත් අදාල	වර්ෂය තුල ලබාදුන් අත්තිකාරම් එම වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පියවා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතු අතර පිළිතුරෙහි සඳහන් පරිදි අදාල කාර්යය අවසන් කර දින 10 ක් තුල ලබාදුන් අතුරු අග්‍රිමය පියවීමට පියවර ගත යුතුය.

දින වන විට පියවා නොතිබුණි. තවද එම රෙගුලාසිය ප්‍රකාරව අදාල කාර්යය අවසන් කර දින 10 ක් තුල එම අතුරු අග්‍රිමය පියවිය යුතු වුවත් 2024 අප්‍රේල් මාසය තුලදී විගණනය විසින් පරීක්ෂා කරන ලද අවස්ථා 08 ක දී ලබා දුන් එකතුව රු.643,200 ක් වූ අත්තිකාරම් පියවීමට අදාල කාර්ය නිමකර දින 46 සිට දින 93 දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි.	වවුචරය අඩුපාඩු සහිතව මුදල් අංශයට පැමිණි අතර එම අඩුපාඩු සකස් කර නැවත එවන ලෙස අදාල පාර්ශවයන් දැනුවත් කළ බවත් අදාල පාර්ශවයන් දැනුවත් කර ඉදිරියේ දී මෙය වලක්වා ගැනීමට කටයුතු කරනු ලබන බව

1.7 සම්බන්ධිත පාර්ශවයන් හා සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හෙළිදරව් නොකිරීම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
විශ්වවිද්‍යාලයේ ඉහළ කළමණාකාරිත්වය දරන පුද්ගලයකුගේ බිරිඳකට අයත් නිවසක් රු.40,000 ක මාසික කුලියකට 2025 ජනවාරි 01 දින සිට 2025 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදයකට විශ්වවිද්‍යාලයේ නේවාසිකාගාරයක් සඳහා කුලියට ලබා දී තිබුණු අතර ඒ සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 836 ප්‍රකාරව විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි .	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ පීඨ නවයට (09) අයත් සිසුන් 9,500 ක් පමණ අධ්‍යාපනය ලබන අතර මේ වනවිට විශ්වවිද්‍යාලය විසින් කුලියට ගත් නිවාස සහ විශ්වවිද්‍යාලය සතුව පවතින නේවාසිකාගාරවල නේවාසික පහසුකම් සැපයිය හැකිව තිබෙන්නේ සිසුන් 5,000 ට ආසන්න පිරිසකට පමණක් බවත්,විශ්වවිද්‍යාල ශිෂ්‍ය නේවාසිකාගාර වල පවතින ඌනතාවන් සැලකිල්ලට ගෙන විශ්වවිද්‍යාලයේ සේවයේ නියුක්ත සේවකයින්ගේ මෙන්ම විශ්වවිද්‍යාල පාලක සභාවට සම්බන්ධ නිලධාරීන්ගේ නිවාස බොහොමයක් ද විශ්වවිද්‍යාලයේ අවශ්‍යතාවය සඳහා අතීතයේ සිටම ලබා ගෙන ඇති බව	මෙම ගණුදෙනුව සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන තුලින් හෙළිදරව් කිරීමටත්, මෙවැනි ගිවිසුම් වලට එළඹීමේ දී අදාල අමාත්‍යාංශ ලේකම්ගේ අවසරය ලබා ගැනීමටත් කටයුතු කල යුතුය.

1.8 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(i) (ඇ) වගන්තිය	විශ්වවිද්‍යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී එකී විධි විධාන ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.	පවතින අභ්‍යන්තර පාලන පද්ධතිය ඉදිරියේ දී සඵලදායීව හා විධිමත්ව ස්ථාපිත කර පවත්වාගෙන යාමට හා ඒවායේ ලිඛිත සමාලෝචනයන් විගණකාධිපති වෙත වාර්තා කිරීමට කටයුතු කරනු ලබන බව	විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලන පද්ධතිය සඵලදායි කිරීමට පියවර ගත යුතුය.
(ආ)	මුදල් රෙගුලාසි 751 හා 756	උසස් අධ්‍යාපනය කඩිනම් කිරීමේ සහ සංවර්ධනය වේගවත් කිරීමේ ව්‍යාපෘතිය (AHEAD) මඟින් 2018 සිට 2024 වර්ෂය දක්වා විශ්වවිද්‍යාලය වෙත ලබා දී තිබුණු එකතුව රු.1,584,604,644 ක් වූ වත්කම් හා විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (STHRD) මඟින් 2019 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා ලබා දී තිබුණු එකතුව රු.1,871,437,904 ක් වූ වත්කම් අදාළ රෙගුලාසි ප්‍රකාරව ලේඛන ගත කර නොතිබීම හේතුවෙන් එම වත්කම් සම්බන්ධයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.	ව්‍යාපෘතියට අදාළව පැවති ලිපිගොනු මඟින් සියලු පිරිවැය සහිතව භාණ්ඩ ලැයිස්තුව ලේඛනගත කර ඉදිරියේ දි වාර්තා කිරීමට කටයුතු කරන බවත්, එම ලේඛන ඉදිරි වර්ෂයේ දී භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා අදාළ කර ගනු ලබන බව	වත්කම් අදාළ රෙගුලාසි ප්‍රකාරව ලේඛන ගත කර එම වත්කම් සම්බන්ධයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදුකළ යුතුය.

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය V වැනි පරිච්ඡේදයේ 7.6 හා 7.8 ඡේදය				
	(i)	2000 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ දී, අධ්‍යයන නිවාඩු ලබා විදේශගත වී තිබුණු නිලධාරීන් 13 දෙනෙකුගෙන් බැඳුම්කර කඩකිරීම හේතුවෙන් අයවිය යුතු රු.68,561,320 ක් විගණිත දිනය වූ 2025 ජුනි 25 දින වන විටත් අයකරගෙන නොතිබුණි.	ආයතන අධ්‍යයන අංශය මඟින් බැඳුම්කර කඩකිරීම්වල අයකිරීම් හා අනෙකුත් සියලු අයකිරීම් අයකර ගැනීමට කටයුතු සිදු කරනු ලබන බව	ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූලව බැඳුම්කර කඩකිරීමේ හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
	(ii)	2015 සිට 2023 කාලපරිච්ඡේදය තුළ දී වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා විදේශගත වූ නිලධාරීන් 05 දෙනෙකු හා දේශීය අධ්‍යයන නිවාඩු ලබාගත් නිලධාරීන් 03 දෙනෙකු අධ්‍යයන කටයුතු නිම නොකර නැවත සේවයට වාර්තා කිරීම හේතුවෙන් අයවියයුතු රු.62,069,887 ක් වූ බැඳුම්කර වටිනාකම විගණිත දිනය වූ 2025 ජුනි 25 දින වන විටත් අයකරගෙන නොතිබුණි.	අධ්‍යයන කටයුතු නිම නොකර නැවත සේවයට වාර්තා කල නිලධාරීන් 08 දෙනෙකුගෙන් 2025.06.25 දිනට රු. 62,069,887.55 ක් අයකර ගත යුතු බව	ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූලව බැඳුම්කර කඩකිරීමේ හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ) 04/2016 දරන හා 2016 මාර්තු 01 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ 05 වගන්තිය			.	
	(i)	විශ්වවිද්‍යාලය විසින් පශ්චාත් උපාධි අධ්‍යන පීඨය මඟින් පවත්වාගෙන යනු ලබන උපාධි පිරිනමනු ලබන පාඨමාලා 05ක් සඳහා චක්‍රලේඛය ප්‍රකාරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ	අදාල පාඨමාලා 05 සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාළ පියවර මේ වනවිට ගෙන ඇති බව	විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා සඳහා අදාල චක්‍රලේඛය ප්‍රකාරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ

		අනුමැතිය ලබා ගෙන නොතිබුණි.		යුතුය.
	(ii)	ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් වලින් උත්පාදිත ආදායම් වලින් එම පාඨමාලා සඳහා දැරිය යුතු ඍජු හා වක්‍ර වියදම් දැරිය යුතු බව දක්වා තිබියදී එම චක්‍රලේඛය උල්ලංඝණය කරමින් විවෘත හා දුරස්ථ අධ්‍යාපන කේන්ද්‍රයේ කටයුතු වලින් පරිබාහිර වෙනම ඒකකයක් ලෙස පවත්වාගෙන යනු ලබන විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර සබඳතා ඒකකයේ (UBLC) කළමනාකරණ තනතුර වෙනුවෙන් රු.724,500 ක මුදලක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.	UBLC ඒකකයේ කළමනාකාර තනතුර සඳහා ස්වයං මූල්‍ය ආදායම්වලින් වැටුප් ගෙවීම සඳහා 2024.09.03 දිනැති 313 පාලක සභාව මඟින් සහ 2024.12.19 දිනැති 240 වන මුදල් කමිටුව මඟින් ද අනුමැතිය ලබාගෙන ඇති බව	UBLC ඒකකය තුලින් අපේක්ෂිත කාර්ය භාරය ඉටු වී නොමැති බැවින් ස්වයං මූල්‍ය ඒකකයක් ලෙස UBLC ඒකකය ආදායම් ඉපයිය හැකි ඒකකයක් බවට පත්කිරීමත්, විශ්වවිද්‍යාලයෙහි පවත්නා ස්වයංමූල්‍ය ඒකකයන් වල ස්වාධිනත්වය ආරක්ෂා වන පරිදි ආදායම් ගිණුම්ගත කිරීම හා වියදම් දැරීම කළ යුතුය.
(ඉ)	2023 මැයි 09 දිනැති අංක 02/2023 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන චක්‍රලේඛයෙහි 3.5 වගන්තිය	විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන සඳහා අවශ්‍ය තොරතුරු සැපයීම සඳහාත් කළමනාකරණය සඳහා වාර්තාවක් සැපයීම සඳහාත් ගොවිපළෙහි සියලුම ගනුදෙනු ගිණුම්ගත කිරීම සඳහා සුදුසු ක්‍රියා පටිපාටියක් හා වෙන් වූ වාර්තා නඩත්තු කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.	මේ වන විටත් අදාල අනුමැතිය ලබා ගෙන ඇති අතර අවශ්‍ය කටයුතු සිදු කරනු ලබන බව	ගොවිපළෙහි සිදුවන ගණුදෙනු විධිමත් කිරීම සඳහා සියලුම ගනුදෙනු ගිණුම්ගත කිරීමට සුදුසු ක්‍රියා පටිපාටියක් හා වෙන වෙනම වූ වාර්තා ද නඩත්තු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් හා මෙහෙයුම් නොවන ප්‍රතිඵලය රු.4,213,346,404 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.505,333,576 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,708,012,828 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට STHRD ව්‍යාපෘති ප්‍රදාන ලැබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

(අ) සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් හා මෙහෙයුම් නොවන ප්‍රතිඵලය සියයට 734 කින් ඉහළයාමට බැදුම්කර කඩකිරීමෙන් අයකරගත් රු. 14,344,442 ක් ද STHRD ව්‍යාපෘතියෙන් ලද රු. 4,635,717,503 ක ප්‍රදාන ද බලපා තිබුණි.

(ආ) තවද සැපයුම් හා පරිභෝජන වියදම් රු. 43,814,220 කින් එනම් සියයට 34 කින් ද,වෙනත් මෙහෙයුම් වියදම් රු. 7,313,399 කින් එනම් සියයට 11 කින් සහ පුනරාවර්තන AHEAD ව්‍යාපෘති වියදම් රු. 57,487,955 කින් එනම් සියයට 99 කින් අඩුවී තිබුණි.

2.3 අනුපාත විශ්ලේෂණය

අනුපාතය	**2024**	**2023**	**වෙනස**
ජංගම අනුපාතය (සියයට)	70	83	13
ද්‍රවශීල / ක්ෂණික අනුපාතය (සියයට)	62	74	12

ජංගම අනුපාතය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 13 කින් හා ද්‍රවශීල / ක්ෂණික අනුපාතය සියයට 12 කින් අවප්‍රමාණය වී තිබුණි. ඒ අනුව විශ්වවිද්‍යාලය පසුගිය වර්ෂයට සාපේක්ෂව කාරක ප්‍රාග්ධනයේ පිරිහීමක් අත්කර ඇති බවට නිරීක්ෂණය විය. තවද 2019 වර්ෂයේ සිට දිගින් දිගටම විශ්වවිද්‍යාලයේ පවත්නා ජංගම වත්කම් ප්‍රමාණය ජංගම වගකීම් පියවීමට ප්‍රමාණවත් නොවන බවද නිරීක්ෂණය විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	**කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	විශ්වවිද්‍යාලයේ Policy and Code of Practice මාර්ගෝපදේශයට අනුව අදාල විෂයය මාලා සෑම වසර 05 ක් ඉක්ම වීමට පෙර සමාලෝචනය කළ යුතු වුවත් විවෘත හා දුරස්ථ අධ්‍යාන කේන්ද්‍රය විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා 06 කට අදාළව වර්ෂ 18 සිට වර්ෂ 06 ක් අතර කාලපරිච්ඡේදයක සිට පාඨමාලා සමාලෝචනය කර නොතිබුණි.	විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය මඟින් මෙහෙයවනු ලබන පාඨමාලා 06 හි විෂයමාලා සමායෝජනයන්හි වත්මන් තත්ත්වය පිළිබඳව අදාළ පීඨවල පීඨාධිපතිවරුන්ගෙන් විමසා ලිපියොමු කර ඇති අතර පිළිතුරු ලද විගස තොරතුරු ඉදිරිපත් කරනු ලබන බව	අදාල විෂයය මාලා සෑම වසර 05 ක් ඉක්ම වීමට පෙර සමාලෝචනය කර වර්තමාන රැකියා වෙළඳපලට හා ගෝලීයකරණයට අනුගත වන පරිදි විෂයමාලා සකස් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.

(ආ)	2019/2020 අධ්‍යයන වර්ෂයේ සිට වර්ෂ 04 ක ලියාපදිංචි කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාලයේ පීඨ 8 කට අනුමත කර තිබුණු සිසුන් සංඛ්‍යාවට වඩා සිසුන් 1,079 දෙනෙකු අඩුවෙන් ලියාපදිංචි කරගැනීම හේතුවෙන් විශ්වවිද්‍යාල අධ්‍යාපනය අපේක්ෂාවෙන් සිටින සිසුන්ට එම අවස්ථාව අහිමි වී තිබුණි.	විශ්වවිද්‍යාලයේ එක් එක් උපාධි පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීමේ සහ පුරප්පාඩු පිරවීමේ කටයුතු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් සිදු කරනු ලබන අතර ශිෂ්‍ය සේවා අංශය විසින් කරනු ලබනුයේ එසේ තෝරා පත්කර එවනු ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් ලියාපදිංචි කිරීම සහ ඊට අදාළ කටයුතු පමණක් බවත් ලියාපදිංචි වීම හෝ නොවීම අදාළ අයදුම්කරුවන්ගේ තීරණයක් වන අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විටින් විට අභියාචනා වට මඟින් එක් එක් පාඨමාලා සඳහා සිසුන්ගේ නම් ලැයිස්තු එවනු ලබන බවත් එවනු ලබන නම් වලින් යම් සිසුන් සංඛ්‍යාවක් වෙනත් පාඨමාලා සඳහා මාරුවීම් සිදුවන බව	මේ සම්බන්ධයෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදීද සාකච්ඡා කළ පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව නියමිත කාලපරිච්ඡේදය තුල අනුමත සිසුන් සංඛ්‍යාව බඳවා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය.
(ඇ)	ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කිරීමට 2024 දෙසැම්බර් 31 දිනට රු.2,440,300ක් වැය කර තිබූ නමුත් 2025 ජුනි 30 දින වන විටත් ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කර අවසන් කිරීමට වගකිව යුතු නිලධාරින් කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.	වත්කම් ලේඛනය සාදා නිම කළ පසුව කෙරීගෙන යන වැඩ ගිණුමෙන් ඉවත් කර ප්‍රාග්ධන ගත කිරීමට කටයුතු කරන බව	ස්ථාවර වත්කම් ලේඛණයක් පිළියෙල කිරීමේ අරමුණින් 2016,2017,2019 හා 2023 වර්ෂයන් ට අදාලව වියදම් දරා ඇති බැවින් මේ සම්බන්ධයෙන් වගකීම පවරන ලද නිලධාරින්ගෙන් කරුණු විමසීමත්, වගකීම නිසි පරිදි ඉටු නොකිරීම සම්බන්ධයෙන් අදාල නිලධාරින්ට එරෙහි පියවර ගැනීමත් සිදුකළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	සබරගමුව විශ්වවිද්‍යාලයට ආරක්ෂක සේවා සැපයීමේ කොන්ත්‍රාත් ගිවිසුම අනුව ස්ථාන 99 ක් ආවරණය කිරීම සඳහා සේවා කණ්ඩ 04 ආරක්ෂක නිලධාරීන් සේවා මුර 6,541 ක් සැපයිය යුතුය. 2024 දෙසැම්බර් මාසය තුළදී සිදු කරන ලද භෞතික විගණන පරීක්ෂාවේදී කාන්තා ආරක්ෂක නිලධාරීන් අවශ්‍ය ප්‍රමාණය	ඇඟිලි සලකුණු යන්ත්‍රය ක්‍රියාවිරහිත වී ඇති බැවින් එය අළුත්වැඩියා කිරීමට භාර දී ඇති අතර නව ඇඟිලි සලකුණු යන්ත්‍රයක් මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව	විශ්වවිද්‍යාලයට ආරක්ෂක සේවා සැපයීමේ කොන්ත්‍රාත් ගිවිසුම අනුව ස්ථාන ආවරණය කිරීම සඳහා ආරක්ෂක නිලධාරීන් ප්‍රමාණවත් පරිදි යොදවා විශ්වවිද්‍යාලයේ ආරක්ෂාව නිසි පරිදි

	ඉක්මවා 32 දෙනෙකු හා අනෙකුත් නිලධාරීන් අවශ්‍ය ප්‍රමාණයට වඩා 1,974 ක් අඩුවෙන් සේවයේ යොදවා තිබුණු බව අනාවරණය විය. ඒ අනුව නිලධාරීන් අවශ්‍ය ප්‍රමාණ සේවයේ නොයෙදවීම හේතුවෙන් විශ්වවිද්‍යාලයේ ආරක්ෂාව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ප්‍රමාණවත් තහවුරුවක් ලබා ගත නොහැකි වූ අතර නිලධාරීන්ට වැටුප් ගෙවීමේ දි ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් පැමිණීම පිටවීම තහවුරු කිරීමේ වාර්තා පදනම් කර ගෙන නොතිබුණි.		තහවුරු කර ගැනීමට පියවර ගත යුතුයි. ආරක්ෂක නිලධාරින්ට වැටුප් ගෙවීමේ දි පැමිණීම පිටවීම තහවුරු කර ගැනීමට විධිමත් ක්‍රමවේදයක් භාවිතා කල යුතුය.
(ආ)	කෘෂි විද්‍යා පීඨයේ අපනයන කෘෂි අධ්‍යන අංශයේ දෙවන වසර පළමු සාමාසිකයේ ගොවිපළ ප්‍රායෝගික පාඨමාලාව හදාරන සිසුන් 07 දෙනෙකු වෙත 2024 ඔක්තෝබර් 31 දින කල්ඉකුත් වූ පිටගැස්ම (Tetanus Toxoid) එන්නත් මාත්‍රා 07 ක් 2024 දෙසැම්බර් 17 දින විශ්වවිද්‍යාලයේ වෛද්‍ය මධ්‍යස්ථානය තුළදී ලබා දීමට කටයුතු කර තිබුණි. ඒ අනුව වෛද්‍ය මධ්‍යස්ථායේ සේවයේ නියුතු නිලධාරීන් නිසි වෘත්තීය සැලකිල්ලකින් (Professional due care) තොරව කටයුතු කර තිබුණු බවත්, කෘෂි විද්‍යා පීඨයේ ගොවිපළ ප්‍රායෝගික පාඨමාලාව හදාරන සිසුන් සඳහා පිටගැස්ම (Tetanus Toxoid) එන්නත්කරණය සිදු කිරීම සඳහා පදනම් කරගත් විධිමත් මාර්ගෝපදේශයක්, චක්‍රලේඛයක් හෝ පීඨ මණ්ඩල තීරණයක් විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.	කෘෂි විද්‍යාපීඨයේ ගොවිපළ ප්‍රායෝගික පාඨමාලාව හැදෑරීමේදී විවිධ උපකරණ හා සතුන්ගෙන් හානි විය හැකි බැවින් දිගු කලක් තිස්සේ පිටගැස්ම එන්නත ලබා දීම සිදුකරනු ලබන බවත් පසුගිය ගොවිපළ ප්‍රායෝගික පාඨමාලාව ආරම්භයේ දී පිටගැස්ම එන්නත ලබා ගැනීමට විශ්වවිද්‍යාල වෛද්‍යවරයාගෙන් අනුමැතිය ඉල්ලා ඇති අතර ඒ අනුව එන්නත් ලබා දීම සිදු කර ඇති බව	පූර්ව අධීක්ෂණ පියවරක් ලෙස පවත්වාගත යුතු “Vaccine Movement Register” ක්‍රමවේදය භාවිතා කිරීමට කටයුතු කල යුතුයි. සාමාසිකයේ ගොවිපළ ප්‍රායෝගික පාඨමාලාව හදාරන සිසුන් සඳහා පිටගැස්ම (Tetanus Toxoid) එන්නත්කරණය සිදු කිරීම සඳහා විධිමත් මාර්ගෝපදේශයක්, අභ්‍යන්තර චක්‍රලේඛයක් හෝ පීඨ මණ්ඩල තීරණයක් ගත යුතුය.
(ඇ)	2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී කෘෂි විද්‍යා පීඨය, වෛද්‍ය පීඨය, භූ විඥාපන පීඨය සහ තාක්ෂණ පීඨය යන පීඨයන්හි උපාධි පාඨමාලා සඳහා අවස්ථා 12 ක දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත සිසුන් සංඛ්‍යාව ඉක්මවා සිසුන් 115 දෙනෙකු විශ්වවිද්‍යාලය විසින් ලියාපදිංචි කර ගෙන තිබුණි.	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විටින් විට එක් එක් පාඨමාලා සඳහා නම් ලැයිස්තු එවන අතර එසේ තෝරා පත්කර එවනු ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් ලියාපදිංචි කිරීම විශ්වවිද්‍යාලය විසින් සිදු කරන බවත් එකී අධ්‍යයන වර්ෂයන් වල පළමු සමාසිකයේ අධ්‍යයන කටයුතු අවසන් වූ පසුවත් සිසුන් ලියාපදිංචිකිරීම් සිදුවන අතර එසේ ලියාපදිංචි වන සිසුන් ඊලඟ අධ්‍යයන වර්ෂයට යොමු කරන බවත්,	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් අනුමත සිසුන් සංඛ්‍යාව ඉක්මවා සිසුන් බඳවා ගැනීමේ දී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතු අතර එලෙස බඳවා ගැනීමට හැකියාව විශ්වවිද්‍යාලයට පවතී නම් අදාල අංශ දැනුවත් කර අනුමත සිසුන් සංඛ්‍යාව වැඩි කර ගැනීමට පියවර ගත යුතුය.

		මෙය අදාළ සිසුන්ගේ ඉල්ලීම මත සිදුවන අතර එසේ කිරීමේදී අනුමත සිසුන් සංඛ්‍යාව ඉක්මවා යාමක් සිදුවන බව	
(ඇ)	උසස් අධ්‍යාපන සහ සංවර්ධනය වේගවත් කිරීමේ (AHEAD) ව්‍යාපෘතිය මගින් විශ්වවිද්‍යාලයේ පර්යේෂණ, නවෝත්පාදන හා වාණිජකරණයන් (Research innovation & commercialization - RIC) දිරිගැන්වීම සඳහා පර්යේෂණ කරන්නන්ට 2018 - 2024 කාලපරිච්ඡේදය තුළදී ලබා දී තිබූ ප්‍රදාන 5 ක් අතරින් ප්‍රදාන 02 කට අදාළව රු.85,000,000 ක් අපේක්ෂිත අරමුණට ළඟා වී නොතිබුණි. තවද මෙම වාණිජකරණය කරන ලද නිෂ්පාදන 05ක් සඳහා විශ්වවිද්‍යාලයට ලැබිය යුතු පුරස්කාර/බලපත්‍ර මුදල් ලබා ගැනීමට 2024 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණු අතර එම පුරස්කාර අයකර ගැනීම සම්බන්ධයෙන් පසුවිපරමක් සිදු කරන බවද විගණනයට නිරීක්ෂණය නොවුණි.	RIC -07 පර්යේෂණ කණ්ඩායම මගින් විද්‍යුත් තැපැල හරහා කරුණු විමසුවද ඒ සඳහා පිළිතුරු නොලැබුණි. RIC -24 මෙම ව්‍යාපෘතියෙන් SULECO Pvt. Ltd සහ බණ්ඩාරවෙල මහනගර සභාව සමඟ අවබෝධතා ගිවිසුමක් මගින් වාණිජකරණය කිරීමට උත්සහ කලත් ආයතනික සීමාවීම් හේතුවෙන් එය ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව හා AHEAD KPI s සම්පූර්ණ කර ඇති බව	RIC යටතේ ලබා දෙනු ලබන ප්‍රදානයන් හි අරමුණ UBLC ඒකකය මගින් වාණිජකරණය කිරීම අරමුණ වුවද RIC 07 හා RIC 24 මගින් අපේක්ෂිත වාණිජකරණ අරමුණ ඉටු වී නොමැති බැවින් මේ සම්බන්ධයෙන් පසු විපරම් කර අදාල පියවර ගැනීමටත්, වාණිජකරණය කරන ලද නිෂ්පාදන සඳහා ගිවිසුම්ගත පුරස්කාර ආදායම්/බලපත්‍ර මුදල් ගිවිසුම්ගත වූ ආකාරයට විශ්වවිද්‍යාලයට ලබා ගැනීමට අවශ්‍ය කඩිනම් පියවර ගැනීමටත් කටයුතු කළ යුතුයි.

3.3 අරමුදල් ඌන උපයෝජනය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යනු ලබන අරමුදල් 6 ක පවතින එකතුව රු.5,259,907 ක ශේෂ වර්ෂ දෙකකට වැඩි කාලයක සිට අදාල අරමුණු වෙනුවෙන් උපයොජනය කර නොතිබුණි.	Foreign student's scholarship funds අදාලව ශිෂ්‍යයා තවම අදාල පීඨයේ අධ්‍යයන කටයුතු කරනු ලබන බැවින් අදාල මුදල එම අරමුදලට ආපසු යැවීමට හෝ රජයේ ආදායමට ගැනීමට නොහැකි බැවින් මෙලෙස පවතිනු ඇති බවත් සහ Demarketing boundaries of rural tanks ව්‍යාපෘතිය යටතේ දක්වා ඇති රු.240,000 ක මුදල අදාල වනුයේ ආදිවාසී ජන කේන්ද්‍රය විසින් පවත් වනු ලබන පාඨමාලාවක් සඳහා බැවින් ඒ අනුව එය නිවැරදි කිරීමට කටයුතු කරන බව හා අනෙකුත් අරමුදල්හි ක්‍රියාකාරීත්වය පිළිබඳ විමසා අදාල සම්බන්ධීකාරකයන්ට ලිපි යොමු කර ඇති බව	මෙම අරමුදල් ව්‍යවස්ථාපිත නොවන අරමුදල් නම් එම අරමුදල් සම්බන්ධයෙන් භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය.

3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන (STHRD) ව්‍යාපෘතියේ ප්‍රතිපාදන මත ඉවතලන ආහාර කිලෝග්‍රෑම් 200 – 250 ක ප්‍රමාණයකින් කොම්පොස්ට් පොහොර නිෂ්පාදනය කල හැකි යන්ත්‍රයක් රු.12,400,000 ක් වැයකර 2024 අප්‍රේල් මාසය තුල සම්පත් පියස තුළ ස්ථාපිත කර තිබුණි. එහෙත් එම යන්ත්‍රය ක්‍රියාත්මක කළ හැකි තාක්ෂණික පුහුණුව සහිත නිලධාරීන් නොමැති වීම හේතුවෙන් 2025 ජුනි 30 දින වන විටද නිශ්කාර්යව පැවතුණි. එබැවින් විශ්වවිද්‍යාලයෙන් දිනකට ඉවතලන ආහාර කිලෝග්‍රෑම් 437 ක් පමණ බැහැර කරන නමුත් එම ද්‍රව්‍ය යොදා ගනිමින් අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමට අපොහොසත් වී තිබුණි.	කොන්ත්‍රාත්කරුවන් විසින් සම්පත් පියසේ පිහිටා ඇති කොම්පෝස්ට් යන්ත්‍රය ක්‍රියාත්මක කිරීම පිළිබඳ පුහුණු සැසිවාර සාර්ථකව පවත්වන ලද බවත් මෙම යන්ත්‍රය මඟින් ප්‍රශස්ත ප්‍රථිඵල අත් කර ගැනීමේ අරමුණින් එනම් බාධාවකින් තොර කාර්යක්ෂම ක්‍රියාවලියක් සහතික කිරීම සඳහා වෘත්තීය කණ්ඩායම් සමඟ එක්ව කොම්පෝස්ට් යන්ත්‍රයේ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට පියවර ගනු ලබන බවත් මීට අවශ්‍ය කරන සේවකයන්ගේ අඩුවක් විශ්වවිද්‍යාලය තුළ පවතින බැවින් මේ සඳහා සුදුසු හා තාක්ෂණික දැනුම අතින් පරිපූර්ණ සේවකයන් විශ්වවිද්‍යාලයට බඳවා ගන්නා ලෙස ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව	විශ්වවිද්‍යාලයෙන් දිනකට ඉවතලන සියයට 50 ක පමණ ආහාර ප්‍රමාණයක් භාවිතා කරමින් කොම්පෝස්ට් නිෂ්පාදනය කල හැකි පරිදි ඉදිකරන ලද මෙම යන්ත්‍රය කඩිනමින් කොම්පෝස්ට් නිපදවීමේ ක්‍රියාවලියට යොදා ගනිමින් විශ්වවිද්‍යාලයේ අපද්‍රව්‍ය කළමණාකරන ක්‍රියාවලිය විධිමත් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.
(ආ)	උසස් අධ්‍යාපන සහ සංවර්ධනය වේගවත් කිරීමේ ව්‍යාපෘතිය (AHEAD) යටතේ ගොවිපොළට ලබාදී තිබූණු රු.95,000 ක් වූ කිරි දෙවීමේ යන්ත්‍රය වසර 02 ක කාලයක සහ රු. 1,090,500 ක් වූ තණකොල කැබලි කිරීමේ යන්ත්‍රය වසර 03 ක කාලයක සිට අළුත්වැඩියා කිරිමට කටයුතු නොකිරීමෙන් නිෂ්කාර්යය තත්වයේ පැවතුණි. තවද වටිනාකම ඉදිරිපත් නොවූ Milking Machine Sezer යන්ත්‍රය, Generator, Tube Well වසර දෙකක පමණ	කිරි දෙවීමේ යන්ත්‍රය හා තණකොල කැබලි කිරීමේ යන්ත්‍රය අලුත්වැඩියා කරමින් පවතින අතර ඉන් පසුව භාවිතයට ගන්නා බව Milking Machine-Milkkary යන්ත්‍ර 2 උපකරණ අළුත්වැඩියා කලහැකි සමාගමකට යොමුකර අළුත්වැඩියා කටයුතු කිරීමට කටයුතු කරන බව Generator - අළුත්වැඩියා කටයුතු සඳහා වන සුදුසු ආයතනයක් සම්බන්ධ	කඩිනමින් වත්කම් අළුත්වැඩියා කර ඵලදායී ලෙස උපයෝජනය කිරීමට පියවර ගත යුතුය.

	කාලයක සිට අක්‍රියව පැවතුණි.	කර ගැනීම සඳහා සාමාන්‍ය පාලන අංශය වෙත යොමු කර ඇති බව Tube Wells - නළ ලිං සඳහා වන ප්‍රධාන විදුලි සැපයුම ජෙනරේටරය හා සම්බන්ධ වන පරිපථය හා සම්බන්ධව ඇති බැවින් ජෙනරේටරය අළුත්වැඩියා කිරීමෙන් පසුව නළ ලිං අළුත්වැඩියා කිරීමට කටයුතු කරන බවත්, මේ සඳහා වන පූර්ව නිරීක්ෂණ කටයුතු සඳහා ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය සම්බන්ධ කර ගැනීමට කටයුතු යොදා ඇති බව	
(ඇ)	උසස් අධ්‍යාපන සහ සංවර්ධනය වේගවත් කිරීමේ ව්‍යාපෘතිය (AHEAD) මගින් 2022 සැප්තැම්බර් මිලදී ගෙන තිබුණු රු. 3,000,000 ක් වූ Tea roller, Tea dryer හා Roll breaker යන උපකරණ සිසුන්ගේ අධ්‍යයන කටයුතු වෙනුවෙන් භාවිතා නොකර විගණිත දිනය වූ 2025 ජූනි 30 දින දක්වාම නිෂ්කාර්යව පැවතුණි. එමෙන්ම ව්‍යවහාරික විද්‍යා පීඨය සඳහා 2019 ඔක්තෝබර් මිලදී ගෙන තිබුණු රු. 3,133,750 ක් වූ NUVE වර්ගයේ ශීතකරණය (Freezer) ඊට ගැලපෙන වායුසමීකරණ පහසුකම් සහිත සුදුසු ස්ථානයක ස්ථානගත නොකිරීම හේතුවෙන් 2023 ජූලි 01 දින සිට විගණිත දිනය වූ 2025 ජූනි 30 දින දක්වාම අක්‍රීයව පැවතුණි.	එම ව්‍යාපෘතිය මගින් Tea roller, Tea dryer හා Roll breaker යන උපකරණ මුංගස්තැන්න ප්‍රදේශයේ ඇති විද්‍යාගාර, නව කෘෂි පීඨ ගොඩනැගිල්ලට ගෙන යාමෙන් හිස් වන විද්‍යාගාරයක Tea processing Unit ලෙස ස්ථාපිත කිරීමේ අපේක්ෂාවෙන් මිලදී ගන්නා ලද බව නමුත් නව පීඨ සංකීර්ණය ඉදි කිරීමට ප්‍රමාද වීමත් සමඟ එම කටයුත්තද ප්‍රමාද වූ අතර ඒ සඳහා තෙකලා විදුලිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස සාමාන්‍ය පාලන අංශය දැනුවත් කර ඇති අතර ගොඩනැගිලි පහසුකම් සලසා දීම සඳහා ඉඩම් හා ගොඩනැගිලි කමිටුවට (LBMC) ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති බව	ඉහළ වටිනාකම් සහිත මෙවැනි වත්කම් මිලදී ගැනීමට පෙර අදාල වත්කම් ස්ථානගත කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රමාණවත්ද යන්න හා, වත්කම් මිලදී ගැනීමේ දී වත්කම් වල සත්‍ය අවශ්‍යතාවය විශ්ලේශණය කර ප්‍රශස්ත තීරණ ගැනීමත් සිදු කළ යුතු අතර මෙලෙස නිශ්කාර්යව පවතින වත්කම් කඩිනමින් අදාල අරමුණු සඳහා යොදවා ගැනීමට හැකි ක්‍රමවේදයන් කඩිනමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුයි.

3.5 ප්‍රසම්පාදන කළමණාකරනය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 වර්ෂය සඳහා අනධ්‍යාන කාර්යය මණ්ඩලයේ නිලධාරීන් 177 දෙනෙකු සඳහා නිල ඇඳුම් වර්ග 20 ක් මිලදී ගැනීමට තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කිරීමකින් තොරව මිල ගණන් කැඳවා ලංසු ලේඛන 2023 නොවැම්බර් 22 දින විවෘත කර තිබුණද ලංසු විවෘත කිරීමේ දින සිට ලංසු ඇගයීම සඳහා දින 102 ක කාලයක් ගත වීම හේතුවෙන් වලංගු කාල සීමාව තුළදී ලංසුව ප්‍රදානය කිරීමට නොහැකිවී තිබුණි. ලංසු ලේඛණ විවෘත කිරීමෙන් පසු තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කර තිබීම හේතුවෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1 (අ) (ii) ඡේදය අනුව පිරිවිතර ඇගයීමේ වගකීම ඉටු වී නොතිබුණි. 2024 වර්ෂය සඳහා නිලධාරීන්ට හිමි නිම් ඇඳුම් ලබාදීම ද 2025 ජූනි 30 දින විටත් සිදු කිරීමට නොහැකි වී තිබුණි.	2024 වර්ෂය සඳහා නිල ඇඳුම් ලබාදීම වෙනුවෙන් ආයතන අංශය විසින් 2023.10.10 දින ඉල්ලීම් සිදුකර ඇති බවත්, 2023.11.07 දින ලංසු කැඳවීම් සිදුකර 2023.11.22 දින ලංසු විවෘත කර 2023.12.01 දින තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඇගයීම් කටයුතු සඳහා යොමුකර ඇති බවත් තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව 2024.02.24 දින ලැබී ඇති බවත් ඉතා දිර්ඝ කාලයක සිටම නිළ ඇඳුම් ප්‍රසම්පාදනය සිදු කර ඇත්තේ නියමිත වර්ණයක් හෝ රෙදි වර්ගයක් නිශ්චිතව ප්‍රකාශ කිරීමකින් තොරව බවත් සඳහන් කර තිබුණි. රුපියල් මිලියන 10 නොඉක්මවන සම්මත පිරිවිතරයන්ගෙන් සමන්විත වෙළඳ භාණ්ඩ මිල දී ගැනීමේදී ද පූර්ව තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර එහි නිර්දේශ මත ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට පියවර ගන්නා බව	විශ්වවිද්‍යාලය විසින් නිල ඇඳුම් මිලදී ගැනීම සඳහා වර්ෂ කිහිපයකදී සිදු කරන ලද ප්‍රසම්පාදනයන් හි අක්‍රමවත්භාවයක් නිරීක්ෂණය වූයෙන් එම තත්ත්වය වලක්වා ගැනීමට හැකි පරිදි ප්‍රසම්පාදන ක්‍රමවේදය විධිමත් කර නිසි කාලවේලාව තුලදී නිල ඇඳුම් ලබා දීමට පියවර ගත යුතුය.
(ආ)	විශ්වවිද්‍යාලයේ තනතුරු 06 ක කාන්තා නිලධාරීන් 54 දෙනෙකු සඳහා 2022 වර්ෂයට අදාලව නිල ඇඳුම් මිලදී ගැනීම සඳහා ලංසු කැඳවීමේ දී පැවති අඩුපාඩු හේතුවෙන් අවස්ථා 06 කදී නැවත නැවතත් මිල ගණන් කැඳවා 2023 දෙසැම්බර් 06 දින රු.576,150 ක් වටිනාකමැති සාරි හා සාරි හැට්ට රෙදි 138 ක් සැපයුම්කරුවෙකුගෙන් ලබා ගෙන තිබුණි. එහෙත් මෙම නිල ඇඳුම් ලබා ගැනීම අදාල නිලධාරීන් විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් 2025 ජනවාරි 20 දින සැපයුම්කරු වෙත නැවත භාර දී තිබුණි.	2023 වර්ෂය සඳහා මිල දී ගත් නිළ ඇඳුම් (සාරි පමණක්) ලබා ගැනීම නිළ ඇඳුම්ලාභීන් වෘත්තීය සංගම් මගින් ලිඛිතව ප්‍රතික්ෂේප කර ඇති හෙයින් උපකුලපතිතුමාගේ අනුමැතිය ඇතිව 2025 ජනවාරි 20 දින අදාල සැපයුම්කරුවෙත නැවත බාරදුන් බව චක්‍රලේඛ අංක 15/1989 අනුව වර්තමාන නිල ඇඳුම් ප්‍රසම්පාදනයේදී රෙදි වර්ගය වර්ණය පිළිබඳ විවිධ ගැටළුකාරී තත්වයන් මතුව ඇති බැවින් විශ්ව විද්‍යාලයේ මූල්‍යාධිකාරී හා ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී සැපයුම්, සහකාර ලේඛකාධිකාරී	විශ්වවිද්‍යාලය විසින් නිල ඇඳුම් මිලදී ගැනීම සඳහා වර්ෂ කිහිපයකදී සිදු කරන ලද ප්‍රසම්පාදනයන් හි අක්‍රමවත්භාවයක් නිරීක්ෂණය වූයෙන් එම තත්ත්වය වලක්වා ගැනීමට හැකි පරිදි ප්‍රසම්පාදන ක්‍රමවේදය විධිමත් කර නිසි කාලවේලාව තුලදී නිල ඇඳුම් ලබා දීමට පියවර ගත යුතුය.

		ආයතන අනධ්‍යයන, වෘත්තීය සංගම් නියෝජිතයින් අතර සාකච්ඡාවක් පවත්වා නිල ඇඳුම් ප්‍රසම්පාදනය සඳහා අවශ්‍ය නිවැරදි පිරිවිතරයන් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සඳහා , සහකාර ලේඛකාධිකාරී ආයතන අනධ්‍යයන වෙත ලිඛිත දැනුම් දීමක් සැපයුම් අංශය මගින් සිදුකර ඇති බව	
(ඇ)	විශ්වවිද්‍යාලයේ 2024/2025 වර්ෂය සඳහා පවිත්‍රතා, සනීපාරක්ෂක හා උද්‍යාන නඩත්තු සේවයෙහි කොන්ත්‍රාත්තුව සේවකයින් 165 දෙනෙකු සේවයේ යෙදවීමේ පදනම මත රු. 116,504,645 කට පෞද්ගලික ආයතනයක් වෙත ප්‍රදානය කර තිබුණු නමුත් 2023/2024 වර්ෂයේදී එම කොන්ත්‍රාත්තුව සේවකයින් 158 දෙනෙකු සේවයේ යෙදවීමේ පදනම මත රු. 64,134,867 කට වෙනත් පෞද්ගලික ආයතනයක් ලවා ඉටුකර ගෙන තිබුණි. මෙහිදී 2023/2024 වර්ෂයට සාපේක්ෂව සේවකයින් 7 දෙනෙකු පමණක් වැඩිවීමත්, එක් පිරිමි හා කාන්තා සේවකයකු සඳහා පිළිවෙලින් රු.100 ක් හා රු.200 ක් පමණක් වැඩිවීම හා උද්ධමන අනුපාතිකය සීඝ්‍ර ලෙස පහළ යන අවස්ථාවක සියයට 81 ක අසාමාන්‍ය මිල විචලනය පිළිබඳවත් ප්‍රසම්පාදන කමිටුවේ සහ තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිසි අවධානය යොමු වී නොතිබුණි. තවද ගිවිසුම් ගත කාලය 2025 මාර්තු 31 දින ඉකුත් වුවද නැවත ලංසු කැඳවා ප්‍රසම්පාදනය පිරිනැමීම වෙනුවට මෙම සමාගමෙහි ගිවිසුම් කාලය 2025 ජූලි 01 දින දක්වා දීර්ඝ කර තිබුණු බව නිරීක්ෂණය විය.	කාලීනව සිදුවන ලද පිරිවැය ඉහළ යාම ඇගැයීමේදී විගණන විමසුමෙහි සඳහන් වන මිල ඉහළ යාමට හේතු වී ඇත. තවද ලංසුව ඇගයීමේදී සමස්ත ලංසු මිල සලකා බලා ඇති අතර අයිතම වශයෙන් සංසන්දනය කර නැත. තවද පවිත්‍රතා සේවකයන්ට ගෙවිය යුතු අවම වැටුප වැඩිවීමක්ද අදාළ වසර සඳහා සළකා බලා ඇති බැවින් ශ්‍රම පිරිවැය 2024/2025 ඉහළ ගොස් ඇති බව. එමෙන්ම පවිත්‍රතා සේවය මගින් රැස් කරන නොදිරන කසල, විධිමත්ව බැහැර කිරීම අනිවාර්ය කරුණක් බව විශ්ව විද්‍යාලය මගින් ගිවිසුම් කොන්දේසි අනුව ලංසුකරුට දැනුම් දී ඇති බවත්, කසළ ප්‍රතිචක්‍රීකරණය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයට මතුවුණු ගැටළු සහ මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබා දී ඇති දැනුම් දීමට අනුව විශ්වවිද්‍යාල පරිශ්‍රයෙන් බැහැරව පරිසර හිතකාමී සහ නීතිමය ක්‍රමවේදයන් අනුගමනය කරමින් කසල ඉවත් කල යුතු බවද ඒ සඳහා වැඩි පිරිවැයක් දැරීමට සිදුවන අතර එම පිරිවැයද ලංසු මිල තුළ ඇතුළත් වන බව	පවිත්‍රතා, සනීපාරක්ෂක හා උද්‍යාන නඩත්තු සේවය සඳහා ලංසු කැඳවීමේ දී වාර්ෂිකව ඒකාකාරී ක්‍රමවේදයක් භාවිතා කිරීමත්, ලංසු කැඳවීමට පෙර අවශ්‍යතාවයන් සඳහන් කරමින් මූලික ඇස්තමේන්තුවක් සකස් කිරීමට පියවර ගැනීමත්, අසාමාන්‍ය මිල විචලනයන් පවතින අවස්ථා වල ඒ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් ගේ අවධානය යොමු කරවීමත් කළ යුතුය.

3.6 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1996 මැයි 07 දිනැති අක 679 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය මඟින් සංශෝධිත ආරක්ෂක පරීක්ෂක II ශ්‍රේණියේ බඳවා ගැනීමේ පරිපාටියේ සුදුසුකම් I (ආ) II අනුව පොලිස් සේවයේ හෝ හමුදා සේවයේ හෝ විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ ආරක්ෂක සේවයේ හෝ වෙනත් පිළිගත් ආරක්ෂක සේවා ආයතනයක වසර පහකට (5) නොඅඩු සතුටුදායක සේවා කාලයක් තිබිය යුතු බව දක්වා තිබුණි. එහෙත් පෞද්ගලික ආරක්ෂක සේවා ආයතනයක 2002 මැයි 06 දින සිට 2008 ඔක්තෝබර් 04 දින දක්වා පූර්ණ කාලීනව සේවය කල බවට ව්‍යාජ සහතිකයක් ඉදිරිපත් කරන ලද පුද්ගලයකු ආරක්ෂක පරීක්ෂක (II) ශ්‍රේණියේ පිරිමි තනතුරට බඳවා ගෙන තිබුණි.	මේ වන විට ආරක්ෂක පරීක්ෂක (II) ශ්‍රේණියේ පිරිමි තනතුරට බඳවා ගැනීම සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකිරීම සඳහා කමිටුවක් පත් කරනු ලැබ ඇත. එම විමර්ශනය දැනට සිදුකෙරෙමින් පවතින බව.	විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කර ලබා දී ඇති නිර්දේශයන්ට අනුගතව කටයුතු කිරීමත්, විශ්වවිද්‍යාලයට සේවකයින් බඳවා ගැනීමේ දී නියමිත විධිවිධානයන්ට අනුගතව කටයුතු කිරීමටත් පියවර ගත යුතුය.
(ආ)	සබරගමුව විශ්වවිද්‍යාලයේ කෘෂිවිද්‍යා පීඨයට අයත් ගොවිපළෙහි කළමනාකරණ තනතුර 2022 නොවැම්බර් 01 දින සිට පුරප්පාඩුවී පැවතීම එම ආයතනයෙහි අධීක්ෂණ හා පරිපාලන කටයුතු කෙරෙහි සෘජුවම බලපාන බව නිරීක්ෂණය විය.	ගොවිපල කළමනාකරු බඳවා ගැනීම සඳහා අවශ්‍යය ඉල්ලීම් අදාල අංශ වෙත දැනුවත් කර ඇති බව	ගොවිපළ කළමනාකරුවෙකු නොමැති වීමෙන් වන බලපෑම සම්බන්ධයෙන් අදාල අංශ දැනුවත් කර මෙම තනතුර සඳහා බඳවා ගැනීම කඩිනම් කළ යුතුය.

3.7 වාහන පද්ධතිය කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය 2.1.1 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව මෝටර් වාහනයක් එම වාහනය අයත් විශ්වවිද්‍යාලයක ලේඛකාධිකාරිවරයා ගේ තනතුරු නාමයෙන් ලියාපදිංචි කල යුතු වුවත්	මේ සම්බන්ධයෙන් 2024.12.30 දින පැවති 313 වන විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතිය ලැබී ඇති අතර අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරනු ලබන බව	ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව විශ්වවිද්‍යාලයට අයත් මෝටර් වාහන ලේඛකාධිකාරිවරයා ගේ තනතුරු නාමයෙන් ලියාපදිංචි කල යුතුය.

	වාහන 13 ක් විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා තනතුරු නාමයෙන් ලියාපදිංචි කර නොතිබුණු බව නිරීක්ෂණය විය.		
(ආ)	2020 ඔක්තෝබර් 02 දිනැති කොම්ප්ට්‍රොලර් ජනරාල් ගේ අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව සබරගමුව විශ්වවිද්‍යාලයට අයත් ධාවන තත්ත්වයේ නොපවතින රු.500,000 ක් වටිනා ගිලන් රථය ඉවත් කිරිමට හා රු.1,500,000 ක් වටිනා ගලි බවුසරය අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට එකී විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	මෙම වාහන වලින් ගිලන් රථය අපහරණය කිරීමට උපකුලපති විසින් පත්කරන ලද විශේෂ කමිටුවක් වෙත අදාළ ලිපි ගොනුව 2024.09.24 දින යොමු කර ඇති බවත්, පවතින මුදල් ප්‍රතිපාදන, අංක SG RA 0757 දරණ ගලි බවුසර රථය අළුත්වැඩියා සිදුකිරීමට හෝ අපහරණ කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බව	මෙම වාහන දෙකද ඇතුලත්ව ධාවන තත්ත්වයේ නොපවතින වාහන සම්බන්ධයෙන් වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 නොවැම්බර් 16 දිනැති හා අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමඟ නිකුත් කළ මෙහෙයුම් අත්පොතෙහි 6.6 ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 60ක් තුළ එම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2025 මාර්තු 28 දින එනම් දින 27 ක ප්‍රමාදයකින් පසු ඉදිරිපත් කර තිබුණි.	2024 අවසන් ගිණුම් පිළියෙල කර 2025 පෙබරවාරි 25 දින විශේෂ 242 වන මුදල් කමිටුව මගින් නිර්දේශ කර 2025 පෙබරවාරි මස 27 දින පැවැත්වීමට නියමිතව තිබූ පාලක සභාවට ඉදිරිපත් කිරීමට දැනුම් දී තිබුණද එම නව පාලක මණ්ඩල සමාජිකයින් විසින් මූල්‍ය ප්‍රකාශන අධ්‍යයනය කිරීමට සති දෙකක කාලයක් අවශ්‍ය බව ලිඛිතව දන්වා තිබුණු බවත් ඒ අනුව මාර්තු 17 දින පැවති පාලක සභාව විසින් පෙන්වා දෙන ලද අක්ෂර සහ ව්‍යාකරණමය අඩුපාඩු ද සකස් කර 2025 මාර්තු 28 වන දින විගණනයට ඉදිරිපත් කර ඇති බව	මූල්‍ය ප්‍රකාශන නියමිත කාලපරිච්ඡේදය තුල විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයක් වන බැවින් ඉදිරියේදී නියමිත විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුය.

4.2 වාර්ෂික වාර්තාව

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
විශ්වවිද්‍යාලය විසින් විගණනයට ඉදිරිපත් කරන ලද කෙටුම්පත් වාර්ෂික වාර්තාවෙහි	උපාය මාර්ග සැලසුම්කරණ කමිටු සභාපති විසින් මේ සම්බන්ධව ලේඛකාධිකාරී සමඟ සාකච්ඡා කර වඩාත් යෝග්‍ය සංවිධාන සැලැසුමක් නිර්මාණය	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා අනෙකුත් විශ්වවිද්‍යාල සමඟ සාකච්ඡා කර එක්

ඇතුලත් සංවිධාන සටහන හා 2024-2028 වර්ෂයන් සඳහා ඉදිරිපත් කරනලද උපක්‍රමික සැලැස්මෙහි ඇතුලත් සංවිධාන සටහනෙහි ධූරාවලිය ගලා යාමේ වෙනස්කම් පවතින බව විගණනයට නිරීක්ෂණය විය	කර ඇති බවත්, 2025 ජූලි මසට නියමිත පාලක සභාවේ අනුමැතිය ලබාගෙන එය ඉදිරියේ දී භාවිතයට ගන්නා බව	සංවිධාන සටහනක් විශ්වවිද්‍යාලය වෙනුවෙන් පිළියෙළ කල යුතුයි.

4.3 පාරිසරික ගැටලු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
උසස් අධ්‍යාපන සහ සංවර්ධනය වේගවත් කිරීමේ (AHEAD) ව්‍යාපෘතිය යටතේ ලද රු.1,950,258 ක මූල්‍ය දායකත්වයෙන් 2021 වර්ෂයේ දී ව්‍යවහාරික විද්‍යා පීඨයේ ඉදිකරන ලද රසායනික කසල දහන යන්ත්‍රයෙහි චිමිනියෙහි උස ගොඩනැගිලි වල ජනෙල් මට්ටමට සමාන මට්ටමකින් ඉදි කිරීම හේතුවෙන් රසායනික කසල දහනයේ දී පිටවන දුම් මඟින් සිදුවන අවහිරතාවය මගහරවා ගැනීමට සිදු කළ යුතු පිළිසකර කිරීම් විගණිත දිනය වූ 2025 ජූනි 30 වන විටද සිදුකර නොතිබුණි. තවද මෙම කසල දහන යන්ත්‍රයෙන් පිටවන රසායනික ද්‍රව්‍ය මිනිස් ශරීරයට අහිතකර ද්‍රව්‍යයන් බැවින් ව්‍යවහාරික විද්‍යා පීඨයට ආසන්න ස්ථානයක මෙම යන්ත්‍රය සවිකිරීමද විගණනයට ගැටළු සහගත විය.	මෙම යන්ත්‍රය සවිකිරීමට හේතුව වූයේ රසායනාගාර වලින් ඉවත් කරන විෂ සහිත (toxic) සහ අපද්‍රව්‍ය සාමාන්‍ය කසල එකතු කිරීමේ ක්‍රම වේදයට එකතුවීම වැලැක්වීම බවත් අවස්ථා කීපයක වෙනත් කසල (රසායනාගාර තුල නැති) යෙදීමෙන් හා පූර්ණ දහනයකට පෙර යන්ත්‍රය ක්‍රියා විරහිත කිරීමෙන් පූර්ණ දහනයකින් තොරව දුම් පිටවී ඇති බවත් රසායනාගාර තුලදී නිසි පරිදි ඉවත් කරන ලද කසල නිසි ලෙස ඇසුරුම් කල යුතු අතර ඉතා ඉක්මනින් බැහැර කිරීම කල යුතු බවද ඊට විසඳුමක් ලෙස ඉතා උසස් තත්ත්වයේ දහනයක් තුලින් පරිසර හානි අවම කිරීමට මෙම යන්ත්‍රය පීඨ සංකීර්ණයට යාබදව සවිකර ඇති බව හා පීඨයේ ඉගෙන ගන්නා සිසුන්ට ද එහි කසල කළමනාකරණය උසස් අන්දමින් පවත්වා ගැනීම ප්‍රායෝගිකව නිරීක්ෂණය කල හැකි බව	සිසුන්,ආචාර්යවරු ඇතුළු බොහොමයක් පිරිසක් ගැවසෙන ප්‍රදේශයක බැවින් මෙම රසායනික කසල දහන යන්ත්‍රය සම්බන්ධයෙන් නියාමන අධිකාරියක නිර්දේශයන් ලබා ගෙන එම නිර්දේශයන් මත අදාල තීරණ ගත යුතුයි.